# සිළුමිණ

சிழுமின The Silumina

■ ආරම්භය - 1930 මාර්තු 30 ■ ප්‍රවෘත්ති පත්‍රයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී ■ 92 වැනි කාණ්ඩය 03 වැනි පත්‍රය ★
■ ශ්‍රී බුද්ධ වර්ෂ 2564ක් වූ මකර රවි 04 භාග දුරුතු පුර ජලවක ඉරිදා ■ වර්ෂ 2021ක් වූ ජනවාරි මස 17 වැනි ඉරිදා මිල රු. 80.00

02 වන්ෂොට් 'හිට් විකට්'

05 පාස්කු ප්‍රහාරයේ 32කට නඩු

06 රෝද තුනක් උඩ ලියැවුණු පදවැල්

15 අනුරපුරෙන් ඇහෙන දැරියන්ගේ අඳෝනාව

16 නුවර මහාමායාවෙන් පොත් වැස්සක්

25 මොකක්ද මේ වරායේ හුටපටේ?

## දුර දුම්රිය සේවා තෙමසකට පසු යළිත්

(තාරක වික්‍රමසේකර)

කොවිඩ් 19 වසංගතය නිසා මාස 3කට අධික කාලයක් අත්හිටුවා තිබූ දුර ධාවන සේවා දුම්රිය රැසක් හෙට (18) සිට ධාවනයට යොදවන බව දුම්රිය සාමාන්‍යාධිකාරී ඩිලන්ත ප්‍රනාන්දු සිළුමිණට කීය. ඒ අනුව කොළඹ කොටුව සිට බදුල්ල (පොඩි මැණිකේ) ගාල්කිස්ස - කන්කසන්තුරේ (යාල් දේවි) මහනුවර - මාතර සීඝ්‍රගාමී මෙන්ම බෙලිඅත්ත - මරදාන (නගරාන්තර සීඝ්‍රගාමී) දුම්රියයන් ධාවනය ආරම්භ කරන බව ඔහු පැවසුවේය. » 2 වැනි පිටුවට

# පාසල් අධ්‍යාපනය වසරකින් අඩුවෙයි

(සුභාෂිණී ජයරත්න)

වසර 13ක් වන පාසල් ... දක්වා අඩු කිරීමට ස... පවතින බව අධ්‍යාප... කපිල සී. පෙරේරා සිළුමිණ...

ඒ අනුව අපොස සාමාන්‍ය පෙළ විභාගය 10 වසරේදී පැවැත්වීමටත් විභාගය පවත්වා මසක් ඇතුළත ප්‍රතිඵල ලබාදීමේ කඩිනම් පැලැස්මක් ඇති කරන බවත් උසස් පෙළ විභාගය 11,12 වසරේදී පවත්වා එහි ප්‍රතිඵලත් මසක් ඇතුළත ලබාදීමෙන් සිසුන්ට අඛණ්ඩ අධ්‍යාපනයක් තුළින් උසස් අධ්‍යාපනයට හෝ වෘත්තීය අධ්‍යාපනය කෙරෙහි යොමුවීමට හැකි වන බව අධ්‍යාපන ලේකම්වරයා අනාවරණය කරයි.

## ගංවතුරෙන් 23,380ක් පීඩාවට

(අමිල මලවිසූරිය) » 2 වැනි පිටුවට

මතට ති...

මේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවට අලුතින්ම පුහුණුව ලත් 20 දෙනකුගෙන් සමන්විත සුනඛ කණ්ඩායම ජනවාරි 15 වැනිදා නිල වශයෙන් සිය රාජකාරි කටයුතු කටුනායකදී ආරම්භ කළ අවස්ථාවයි. ගුවන් තොටුපොළේ ගුවන් භාණ්ඩ ලෙස මගීන් ගෙන යන ගමන්මලුවල රහසිගත ලෙස රැගෙන යා හැකි පුපුරණ ද්‍රව්‍ය සහ මත්ද්‍රව්‍ය පහසුවෙන් හඳුනාගත හැකි වන පරිදි මෙම සුනඛයින්ට පුහුණුව ලබා දී ඇත්තේ අස්ගිරිය සුනඛ පාසැලේදීය. මෙම සුනඛ බළකාය ගොඩ නැඟීම සඳහා රුපියල් දස ලක්ෂ 22ක මූල්‍ය දායකත්වය ලබා දී ඇත්තේ ශ්‍රී ලංකා ගුවන් සේවා අධිකාරිය මඟිනි. 1985 ගුවන් හමුදා සුනඛ ඒකකය ආරම්භ කළ අතර මේ දක්වා සුනඛයින් 69 දෙනකු එයට සම්බන්ධ වී තිබේ.

## 'යළි දකිමු දීඝවාපිය' 22දා

(තාරක වික්‍රමසේකර)

ඉතිහාසයේ ප්‍රථම වතාවට රජයේ මුදල් වැය නොකර දායකත්වයක් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු යොදා ඇතැයි ආරක්ෂක ලේකම් විශ්‍රාමික ජෙනරාල් කමල් ගුණරත්න පවසයි.

ඒ අනුව නැගෙනහිර ප්‍රධාන බෞද්ධ උරුමයක් ලෙස සැලකෙන දීඝවාපි චෛත්‍යය උදෙසා 'යළි දකිමු දීඝවාපිය' නමින් මහජන අරමුදලක් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂයන්ගේ හා අගමැති මහින්ද රාජපක්ෂයන්ගේ ප්‍රධානත්වයෙන් 22 වැනිදා ආරම්භ කෙරෙන බව ලේකම්වරයා පවසයි. » 2 වැනි පිටුවට

## ...ාධිධාරීන් දෙදහසක් තවමත් දෙලොවක් අතර

(සුභාෂිණී ජයරත්න)

උපාධිධාරීන් 50,000 කට රැකියා ලබා දීමේ පදනම මත සිදුව ඇති අසාධාරණය නිසා මේ වන විට තවත් 2,000 කට ආසන්න පිරිසකට රැකියා නොලැබී ඇතැයි උපාධිධාරී ජාතික මධ්‍යස්ථානයේ කැඳවුම්කරු චන්දන සූරියආරච්චි පවසයි. » 2 වැනි පිටුවට

## ශ්‍රමිකයන්ට ජපන් දොර යළි ඇරේ

» 2 වැනි පිටුවට

## සිම්පල් මෑන්

"බැණ බැණ ඉන්නවට වඩා හොඳ නැද්ද සංචාරකයෝ ගෙන්වලා රටයි, ආර්ථිකයයි රැකගන්න විදිහක් ගැන සාකච්ඡා කළොත්.."




## මහාධිකරණයෙන් නිදහස් ජොන්ස්ටන් වැවට බසී!

මේ මහාමාර්ග අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු නිකවැරටිය මාගල්ල වැවේ විනෝදයට ඔරු පදින දසුනක් නොවේ. දේශීය මත්ස්‍ය වගාව ප්‍රචලිත කිරීම සඳහා 'කැටිලා' මත්ස්‍ය පැටවු සහ මිරිදිය ඉස්සන් වැවට මුදාහැරීමෙන් පසු ගනු ලැබූ ඡායාරූපයකි. ශ්‍රී ලංකාවේ වැව්වලින් වයඹ පළාතේ ඇති වැව් සංඛ්‍යාව 6,266කි. මෙම වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ වැඩ සටහනේ විධායක [illegible] කුරුණෑගල දිස්ත්‍රික්කයේදී ක්‍රියාත්මක වේ. මේ අතර මහාධිකරණය ජනවාරි 15 වැනි සිකුරාදා තීරණය කෙළේ සතොස [illegible] ...

## ජනතා සුවයට කෝටි 10,000 ක්

(නිහාල් පී. අබේසිංහ)

2021 අයවැය මඟින් අපේ රටේ කෝවිඩ් - 19 පාලනයට ජනතාවගේ සුව සෙත හා සුව සේවා නැංවීමට සහ රෝහල් සඳහා ඖෂධ නොමිලේ ලබාදීමට රජය රුපියල් කෝටි 9999.7 ක් වෙන්කර ඇතැයි ද අදාළ කටයුතු දැනටමත් අරඹා ඇතැයි ද සෞඛ්‍ය අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් (මුදල්) හේමන්ත ස්වර්ණතිලක පවසයි.

සෞඛ්‍ය ඇමැතිනි පවිත්‍රා වන්නිආරච්චි, ඖෂධ නිෂ්පාදනය හා නියාමනය පිළිබඳ රාජ්‍ය ඇමැති මහාචාර්ය චන්න ජයසුමන හා අමාත්‍යාංශ ලේකම් මේජර් ජනරාල් එස්.එච්. මුණසිංහ යන මහත්වරුන්ගේ උපදෙස් හා මඟ පෙන්වීමට අනුව මේ වසරේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ඉහළම සංවර්ධනයක් මඟින් ජනතා සුව සෙත නැංවීමට දැනටමත් කටයුතු යොදා ඇතැයි හේමන්ත ස්වර්ණතිලක පවසයි. » 2 වැනි පිටුවට